5

# 5 ශ්‍රේණිය
# සිසු නිපුණතා සාධන පරීක්ෂණය
## 2026 ජූලි
## I පත්‍රය

නම ..........................................................................

කාලය පැය 01 යි .

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ **නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **නම** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**
- කටු වැඩ සඳහා කඩදාසියක් යොදා ගන්න.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි .**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

1. පීරිසි කෝප්ප හතරක රූප පහක් A,B,C,D,E මගින් දක්වා ඇත. ඒවා අතුරෙන් එකම පීරිසි කෝප්පය දැක්වෙන රූප දෙක මොනවා ද?


A


B



C



D



E


(1) A සහ B (2) A සහ C (3) C සහ E

2. මුලින් දී ඇති රූපයේ සියලු කොටස් එකතු කර සෑදිය හැකි රූපය වන්නේ,





1


2



3


(1) 1 (2) 2 (3) 3

3. කොටුව තුළ ඇති කාණ්ඩයට ඇතුළත් කිරීමට හැකි පිළිතුර කුමක් ද?




(1)


(2)


(3)

4. A රූපයට සමාන රූපයක් ලබා ගැනීමට B රූපයේ සිදු කළ යුතු වෙනස්කම් ගණන කීය ද?


A රූපය


B රූපය

(1) 1
(2) 2
(3) 3


5. කළු වළාකුළු අහස දිගේ,
පාවෙමින් ආවේ සැණින්.
හමා ආ සුළඟත් සමඟ,
වැසි බිඳු වැටුණි පොළොවට.

කවියේ "සැණින්" යන වචනයට ආසන්න අර්ථය කුමක් ද?

(1) ඉක්මනින් (2) සෙමින් (3) නිතරම

නම ..........................................................................

6. පහත රූපයේ ඇති ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 10 (2) 09 (3) 06

7. වෘත්තාකාර හැඩයේ කේක් ගෙඩියකින් කාලකින් බාගයක් තරාදියේ තැබූ විට එහි බර 250g නම් කේක් ගෙඩියේ මුළු බර කොපමණ ද?

(1) 1 kg (2) 2 kg (3) 1 kg 500g

➢ පිළිවෙළින් B,A,C,D,E යන සිසුන් පස්දෙනා වාඩි වී සිටිති. ඒ අනුව අංක 08 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.

- පළමුව B හා D මාරු වී අසුන් ගන්නා ලදී.
- දෙවනුව A හා E මාරු වී අසුන් ගන්නා ලදී.
- පසුව C හා B ද මාරු විය.

8. දැන් මැද සිටින්නේ කවුද?

(1) D (2) B (3) E


9. පවන් ළඟ කලිසම් 4 ක් කමිස 3 ක් හා සපත්තු ජෝඩුවක් ඇත. ඔහුට ගමනක් යාම සඳහා සූදානම් වී යා හැකි එකිනෙකට වෙනස් ආකාර ගණන කීය ද?

(1) 12 (2) 9 (3) 6

10. ඔරලෝසුවක වේලාව පැයට මිනිත්තු අට බැගින් අඩුවෙන් ගමන් කරයි. මෙම ඔරලෝසුවේ වේලාව පෙරවරු 08.00 ට නිවැරදිව සකසන ලදී. එදින නිවැරදි වේලාව පස්වරු 07.00 වන විට මෙම ඔරලෝසුවේ දැක්වෙන වේලාව කීය ද?

(1) පස්වරු 05.32 (2) පස්වරු 05.18 (3) පෙරවරු 05.32

11. එක පෙළට තබා ඇති එක සමාන භාජන 6 ක් රූපයේ දැක්වේ. එක ළඟ පිහිටි භාජන දෙකක බර අතර වෙනස 40 g වන සේ මෙම භාජන සියල්ලට ම දැමීමට අවශ්‍ය අවම සහල් ප්‍රමාණයෙහි එකතුව කොපමණ ද?




(1) 840 g (2) 180 g (3) 240 g

12. භාජනයකට $\frac{3}{4}$ වන සේ පරිප්පු දැමූ පසු සිරිමල් එහි බර මනින විට 1350g ක් බව පවසන ලදී. පසුව භාජනයට සම්පූර්ණයෙන්ම පරිප්පු පිරවූ විට එහි බර 1750 g ක් විය හිස් භාජනයේ බර කොපමණ ද?


(1) 50g (2) 100g (3) 150g

13. පහත ලී කුට්ටියේ තීන්ත ආලේප කර නැවත කුඩා ඝණකවලට වෙන්කරන ලදී. පැති තුනක පමණක් තීන්ත ගෑවෙන ඝණක ගණන කීය ද?




(1) 8 (2) 12 (3) 16

14. පහත A රූපය කඩඉරි දිගේ නවා B රූපය ලබාගන්නා ලදී. B රූපයේ ඇති කඩඉරි දිගේ කැපූ විට,



A රූපය




B රූපය

(1) ත්‍රිකෝණ කැබලි අටක් ලැබේ.

(2) ත්‍රිකෝණ කැබලි අටක් හා චතුරස්‍ර කැබලි හතරක් ලැබේ.

(3) ත්‍රිකෝණ කැබලි හතරක් හා චතුරස්‍ර කැබලි හතරක් ලැබේ.

15. පහත රූප සටහන සඳහා ගැලපිය හැකි පිළිතුර කුමක් ද?




(1) ශාක, ගස්, වැල්, පඳුරු

(2) මල්, සවස පිපෙන මල්, ජලයේ පිපෙන මල්, උදේ පිපෙන මල්


(3) සතුන්, මත්ස්‍යයන්, සුදු රෙදි හොරා, අශෝක පෙතියා

16. පහත රූපයෙන් දැක්වෙන්නේ ලීවලින් සාදන ලද ඝනවස්තුවකි. එය තිත් ඉරි දිගේ කැපූ විට ලැබෙන කැපුම් මුහුණතේ හැඩය වන්නේ,



(1) ඍජුකෝණාස්‍රයකි (2) ත්‍රිකෝණයකි (3) සමචතුරස්‍රයකි

17. රූපයේ දැක්වෙන වෘත්ත එකම තරමේ ඒවා වේ. A සිට B දක්වා දුරට සමාන කුඩා කොටු ගණන වන්නේ,




(1) 13

(2) 14

(3) 12

➢ කමල් එක්තරා ස්ථානයක සිට මීටර දොළහක් නැගෙනහිර දෙසට ගමන් කොට එතැනින් තම වම් අත දෙසට හැරී මීටර පහක් ගමන් කොට එතැනින් තම දකුණු අත දෙසට මීටර තුනක් ගමන් කරයි.

18. ඔහු දැන් සිටින්නේ ආරම්භක ස්ථානයට කුමන දෙසින් ද?

(1) බටහිර දෙසින් (2) ඊසාන දෙසින් (3) නිරිත දෙසින්

19. රිබන් පටි දෙකක් ගෙන ඒවා තනි පටියක් වන සේ රිබන් පටි දෙකෙහි ම 5 cm බැගින් එක මත එක තබා මසන ලදි. මැසූ පසු රිබන් පටියේ දිග 65 cm නම් මැසීමට ගත් එක් රිබන් පටියක දිග කීය ද?

(1) 40 cm (2) 30 cm (3) 35 cm

20. පසුම්බියක කාසි අටක් ඇත ඒවා රුපියල් දහය, රුපියල් පහ සහ රුපියල් දෙක යන වටිනාකම්වලට අයත් වේ. එහි දහයේ හා පහේ කාසි සමාන ප්‍රමාණයක් ඇත. පසුම්බියේ තිබිය හැකි අඩු ම මුදල කීය ද?

(1) 22 (2) 27 (3) 49


21. යම්කිසි වෙරළු ගෙඩි ප්‍රමාණයක් තුනෙන් බෙදූ විට එකක් ද, හතරෙන් බෙදූ විට දෙකක් ද පහෙන් බෙදූ විට හතරක් ද ඉතුරු වේ. එසේනම් එහි ඇති වෙරළු ගෙඩි ගණන විය හැක්කේ,

(1) 294 (2) 394 (3) 194

22. එක්තරා මාසයක 19, 24, 30 යන දිනයන්ගෙන් දෙකක් සෙනසුරාදා හා ඉරිදා දින වේ. අනෙක් දිනය කුමක් ද?

(1) සිකුරාදා (2) බදාදා (3) අඟහරුවාදා

23. පහත දැක්වෙන සංඛ්‍යා රටාව තේරුම්ගෙන හිස්තැනට ආයුතු සංඛ්‍යාව තෝරන්න.




(1) 26 (2) 28 (3) 27

24. පුස්තකාලය : පොත් නම්

01. ගුවන් යානය : ගුවන් නියමුවා

02. ඔසුසැල : ඖෂධ

03. පාසල : ගුරුවරුන්

25. යන්ත්‍ර 20කින් මිනිත්තු 5ක් තුළ බෝතල් 20ක් නිපදවනු ලබයි. එවැනි යන්ත්‍ර 100කින් බෝතල් 100ක් නිපදවීමට ගතවන කාලය කොපමණ ද?


(1) මිනිත්තු 100 යි (2) මිනිත්තු 20 යි (3) මිනිත්තු 5 යි

26. හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

| | | |
|---|---|---|
| 4 | 3 | 25 |
| 5 | 2 | 29 |
| 6 | 4 | ......... |

(1) 22 (2) 52 (3) 40

27. පහත රූපයේ දැක්වෙන හැඩය සමචතුරස්‍ර හැඩයක් ලෙස සම්පූර්ණ කිරීමට දී ඇති ආකාරයේම කුඩා සමචතුරස්‍ර සහ ත්‍රිකෝණ හැඩ කීයක් අවම වශයෙන් ඊට එකතු කළ යුතු ද?





(1) සමචතුරස්‍ර 10 යි ත්‍රිකෝණ 1 යි

(2) සමචතුරස්‍ර 9 යි ත්‍රිකෝණ 2 යි

(3) සමචතුරස්‍ර 8 යි ත්‍රිකෝණ 3 යි

28. පහත රූපයේ B රෝදය ඊතලයෙන් පෙන්වා ඇති දිශාවට කරකැවුවහොත් A හා C කරකැවෙන්නේ,







(1) (2) (3)

29. පහත රූපයේ හිස් කොටසට ගැළපෙන පිළිතුර වන්නේ,









(1) (2) (3)

30. එක්තරා සිදුවීමක අවස්ථා 4 ක් A,B,C,D රූප මගින් දැක්වේ.


A


B


C


D

එම සිදුවීම නිවැරදිව දැක්වීම සඳහා රූප ගැළපිය යුතු අනුපිළිවෙළ වන්නේ,

(1) A,B,C,D (2) B,C,D, A (3) C,B,A,D

31. සමපාද ත්‍රිකෝණයක් සාදා තිබූ කම්බියක් දිග හැර සෘජුකෝණාස්‍රයක් සාදන ලදී. එහි දිග පළල පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

(1) දිග 10 cm පළල 8 cm
(2) දිග 15 cm පළල 8 cm
(3) දිග 11 cm පළල 8 cm

32. ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක දී ලබාදෙන නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 5 ක් හිමිවන අතර වැරදි පිළිතුරක් ලබා දුනහොත් ලබාගත් ලකුණුවලින් 5 බැගින් අඩු කරනු ලබයි. ප්‍රශ්න 20 ක් සඳහා පිළිතුරු සැපයූ ළමයෙකුට වැඩසටහන අවසානයේ හිමි වූ ලකුණු ප්‍රමාණය 20 ක් නම් ඔහු සැපයූ නිවැරදි පිළිතුරු ගණන කීය ද?

(1) 14 (2) 12 (3) 16

33. කමනිගේ එකම දියණිය පවනි ය. පවනිගේ පුතුණුවන් වන රමිත්ට සිතුම් නමින් එකම සහෝදරයෙක් සිටී. සිතුම්ගේ පියාගේ මව වන මාලිනීට, රමිත් යනු කවුද?

(1) පුතා (2) සහෝදරයා (3) මුණුපුරා

34. ඇතුළත නොපෙනෙණ පෙට්ටියක නිල්, කහ, රතු බෝල පහ බැගින් ඇත. එයට අත දමා අහඹු ලෙස වර්ණ දෙකක බෝල ලැබීමට නම් ගත යුතු අවම බෝල ගණන වන්නේ,

(1) 7 කි (2) 6 කි (3) 5 කි

35. බසයක් 30 වෙනි කිලෝමීටර කණුවේ සිට 35 වෙනි කිලෝමීටර කණුව පසු කිරීමට මිනිත්තු 10ක් ගත කර තිබුණි. බසය එම වේගයෙන් ම ගමන් කළහොත් 80 වෙනි කිලෝමීටර කණුව පසු කිරීමට තවත් මිනිත්තු කීයක් ගතවේ ද?

(1) මිනිත්තු 90 යි (2) මිනිත්තු 45 යි (3) මිනිත්තු 80 යි

36. 9 සිට 1 තෙක් සංඛ්‍යා මෙම කොටු දැළෙහි යෙදිය යුතුය. එහි දී එකම පේළියක හෝ තීරයක ඉරට්ටේ සංඛ්‍යා දෙකක් හෝ ඔත්තේ සංඛ්‍යා දෙකක් එක ළඟ නොපිහිටන පරිදි යෙදිය යුතුය. ඒ අනුව A,C,B ස්ථානවලට පිළිවෙළින් ගැළපෙන ඉලක්කම් වන්නේ,

| | | |
|---|---|---|
| 9 | | Ⓐ |
| Ⓑ | 5 | |
| | Ⓒ | 1 |

(1) 7 , 2 , 4 (2) 7 , 3 ,4 (3) 2 , 4 , 8


37. පඩි 12 ක් ඇති පඩිපෙළක, රුවන් පහළ සිට ඉහළට නඟින්නේ එක් පඩියක මිනිත්තු 2 බැගින් නතර වී සිටිමිනි. රවිඳු ඉහළ සිට පහළට බහින්නේ එක් පඩියක මිනිත්තු 1 බැගින් නතර වී සිටිමිනි. ඔවුන් දෙදෙනා හමුවන්නේ කී වෙනි මිනිත්තුවේ දී ද?


(1) 9 (2) 7 (3) 8

38. පහත දැක්වෙන සිදුවීම පිළිවෙළින් ගැළපූ විට අර්ථවත් සිදුවීමක් ලැබෙන නිවැරදි ආකාරය දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
1. ගඟ පිටාර ගැලුවා
2. ගෙවල් කැඩුණා
3. අහස ගෙරෙව්වා
4. මිනිස්සු අනාථ වුණා
5. වැසි වැස්සා

(1) 1,3,4,5,2 (2) 4,5,3,1,2 (3) 3,5,1,2,4


39. මුලින්ම දී ඇති පතරොම ඇසුරෙන් සෑදිය හැකි ඝන වස්තුව ඇතුළත් පිළිතුර තෝරන්න.




(1) (2) (3)

40. කඩදාසිය මතින් පැන්සල ඉවතට නොගෙන එකම මාර්ගයේ එක වරකට වඩා නොයන සේ මෙම රූපය ඇඳීමට අවශ්‍ය වේ. රූපය ඇඳීම ආරම්භ කළ යුත්තේ කුමන ස්ථානයෙන් ද?




(1) A (2) B (3) C

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහනුවර
மத்திய மாகாண கல்வித்திணைக்களம் - கண்டி
CENTRAL PROVINCIAL DEPARTMENT OF EDUCATION - KANDY

5

# 5 ශ්‍රේණිය
# සිසු නිපුණතා සාධන පරීක්ෂණය
## 2026 ජූලි
## II පත්‍රය

නම .............................................

කාලය පැය 01 යි මිනිත්තු 15 යි.

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්**

- ඔබේ **නම** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- **පස්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබගේ **නම** ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **60** ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
- පිළිතුරු ලියන්නට දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.
- පිළිතුරට යටින් ඉරක් අඳින්න කියා ඇති විට **ඉරක් පමණක්** අඳින්න.
- පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**
- කටු වැඩ සඳහා කඩදාසියක් යොදා ගන්න.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි .**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 02 | |
| 03 | |
| 04 | |
| 05 | |
| 06 | |
| 07 | |
| 08 | |
| එකතුව | |
| අවසාන ලකුණු | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

1. පහත දැක්වෙන ඡේදය කියවන්න.
'ලෝක වැඩිහිටි දිනය' අරමුණු කරගෙන අප පාසලේ විශේෂ වැඩසටහනක් සංවිධානය කරන ලදි. ඒ සඳහා විදුහල්පතිතුමා ප්‍රදේශයේ වැඩිහිටියන්ට ආරාධනා කළේ ය. මෙම වැඩසටහනේ දී සිසුහු ගීත, නර්තන සහ කෙටි නාට්‍ය ඉදිරිපත් කරමින් වැඩිහිටියන් ප්‍රීතියට පත් කළහ. එමෙන් ම සමරු තිළිණ සහ සංග්‍රහයක් ද පිරිනමා ගෞරව දැක්වූහ. එහි දී වැඩිහිටියන්ට ද තම ජීවිත අත්දැකීම් බෙදා ගැනීමට අවස්ථාව ලබා දෙන ලදි. එදින සවස ප්‍රාදේශීය ගුවන් විදුලි නාලිකාවක අප විද්‍යාලය වන විද්‍යාලෝක විද්‍යාලයේ සිදු කළ මෙම වැඩසටහන අගය කරමින් වැඩිහිටියන්ට ආදරය, ගෞරවය සහ සැලකිල්ල දැක්වීමේ වටිනාකම පිළිබඳ අදහස් ප්‍රකාශ කරන ලදි.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

i. මෙම විශේෂ වැඩසටහන පැවැත්වූයේ කුමන විද්‍යාලයේ ද?

.......................................................................................................................................

ii. වැඩිහිටියන් සතුටු කිරීම සඳහා සිසුන් ඉදිරිපත් කළ අංග මොනවා ද?

.......................................................................................................................................

iii. මෙම වැඩසටහන සංවිධානය කරන ලද්දේ කුමක් අරමුණු කර ගෙන ද?

.......................................................................................................................................

iv. **'සතුටට'** යන්නට ඡේදයේ සඳහන් ව ඇති වචනය ලියන්න.

.......................................................................................................................................

v. **"විදුහල්පතිතුමා ප්‍රදේශයේ වැඩිහිටියන්ට ආරාධනා කළේ ය."** යන වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

.......................................................................................................................................

vi. මෙම වැඩසටහනේ දී වැඩිහිටියන්ට ලැබුණු අවස්ථාව කුමක් ද ?

.......................................................................................................................................

2. පහත සඳහන් එක් එක් වගන්තියෙහි හිස්තැනට සුදුසු පදය වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

i. අපි ගුරුවරුන්ට කීකරු ව ඉගෙන .................... (ගන්නෙමු /ගත්හ)

ii. ගොවියා..................... සමඟ අස්වැන්න ගෙට ගත්තේ ය. ( ගෙවිලියක / ගෙවිලයක් )

iii. අමාලි සහ විමාලි කුරුළු හඬට සවන් .............................. (දුන්නා ය / දුන්නෝ ය)

iv. උණ පඳුරු සර සර හඬින් සුළඟට .............................. (සෙළවුණේ ය /සෙළවුණෝ ය)

v. කිරිල්ලී පැටවුන්ට කෑම සොයමින් .............................. (ඉගිලෙති / ඉගිලෙයි )

3. ඒක වචන අතීත කාල පුරුෂලිංග ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න.
(කරයි / කළා ය / කළේ ය / කළහ)

4. පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින්ඉරක් අඳින්න.

i. පිළියෙළ, පිළියෙල, පිලියෙළ

ii. බැබලුණේ ය, බැබළුණේ ය, බැබලුනේ ය

iii. විස්මයාදී ලකුණ, විශ්මයාදී ලකුණ, විස්මයාදී ලකුන

5. පහත සඳහන් වාක්‍යය ලිඛිත බසට හරවා ලියන්න.
ළමයි පරිසරය පිරිසිදු කිරීමට සහභාගි වෙනවා.

.......................................................................................................................................

6. 'අවුරුද්ද' යන වචනයට සමානාර්ථ පදය ලියන්න.

..............................................................................................

'නොදිරන' යන පදයට විරුද්ධාර්ථ පදය ලියන්න.

..............................................................................................

7. පහත සඳහන් වාක්‍යයේ ඇති උපමාව තෝරා ලියන්න.

අහසේ තරු මල් පිපිලා - පොළොවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි - මේ දෙපළ ම හැඩ ගැහිලා

..............................................................................................................................................................................

8.

(i) 'සුදුසු නුසුදුසු දේ පිළිබඳ ව නොතකා යමක් කිරීමෙන් විපාක විඳීම' යන අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරා යටින් ඉරක් අඳින්න.

( මහදැනමුත්තගේ නුවණ වගේ / කට නිසා ඉබ්බා නැහුණා වගේ / ගඟට ඉනි කැපුවා වගේ)


(ii) 'හීන් දාඩිය දැම්මා' යන ඉඟි වැකියේ අදහස ලියන්න.

..............................................................................................................................................................................


9. සුදුසු විරාම ලකුණු යොදන්න.

රජයෙන් ලබා දෙන මහජන ආධාරය හැරුණු කොට ඇයට ජීවත් වීම සඳහා වෙනත් ආදායමක් ද නොවී ය

10. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ **ඉංග්‍රීසි අකුරෙන්** ම ලියන්න.



| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | e | | | b | | | |



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | l | | |

11. පහත එක් එක් වචනයෙහි අර්ථය **සිංහලෙන්** ලියන්න.

(i) triangle - ..................................................................

(ii) letter - ..................................................................

12. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍යයක් බැගින් ලියන්න.

I. a / has / mouth / It / small

..............................................................................................................................................................

II. speak / can / English / I / in

..............................................................................................................................................................

13. 'තලෙයි' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

..............................................................................................................................................

14. පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.
ඔබේ ගම කොහේ ද?

..............................................................................................................................................

15. 23 959 සංඛ්‍යාවේ සියස්ථානයට 1 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

..............................................................

16.

| | |
|---|---|
| 3 | 5 |
| 6 | 8 |

කොටුව තුළ ඇති සියලු ම සංඛ්‍යා යොදාගෙන 3 ඉලක්කමෙන් නිරූපිත අගය 300ක් වන, 8 ඉලක්කමෙන් නිරූපිත අගය 80ක් වන ඉලක්කම් හතරේ සංඛ්‍යා දෙකක් ලියන්න.

..........................................................................................................................

17. කොටුව දුම්රිය ස්ථානයට සතියක් තුළ පැමිණි මගීන් සංඛ්‍යාව පහත දැක්වේ.

| දුම්රිය | පැමිණි මගීන් ගණන |
|---|---|
| යාල්දේවි | 24 209 |
| උඩරට මැණිකේ | 24 019 |
| රුහුණු කුමාරී | 24 091 |

පැමිණ ඇති අඩු ම මගීන් සංඛ්‍යාව අකුරෙන් ලියන්න.

..........................................................................................................................

18. පහත සංඛ්‍යා රටා හඳුනාගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න.

I. 65, 71, 77, ......... , 89

II. 38, ........., 56, 65, 74

19. පාසල් පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා පළමු දින ගඩොල් කැට 3175 ක් ද, දෙවන දින 2095ක් ද ගෙනෙන ලදී. එයින් ගඩොල් කැට 98 ක් කැඩී තිබුණි නම් ඉතුරු ගඩොල් කැට ගණන කීය ද?

..........................................................................................................................

20. වට්ටියක රතු පාට, කහ පාට හා සුදු පාට මල් 56 ක් තිබුණි. එයින් $\frac{3}{4}$ ක් සුදු පාට මල් ය. ඉතුරු මල්වලින් $\frac{1}{2}$ ක් කහපාට මල් ය. වට්ටියේ තිබූ රතු පාට මල් ගණන කොපමණ ද ?

..........................................................................................................................

21. එකිනෙකට සමාන මුහුණත් 4ක් හා ශීර්ෂ 4ක් සහිත ඝන වස්තුව කුමක් ද?

..........................................................................................................................

22. පාත්තියක් වටා මීටර 5 සෙන්ටිමීටර 20ක් දිග ලණුවක් ඇද තිබුණි. එම පාත්තිය නැවත සකස් කළ විට එහි දිග මීටර 6 සෙන්ටිමීටර 5ක් විය. පාත්තිය වටා ඇදීමට තව කොපමණ දිග ප්‍රමාණයක ලණුවක් අවශ්‍ය වේ ද?

..........................................................................................................................

23. පාසලේ උදෑසන රැස්වීම දිනපතා පෙරවරු 7.10ට ආරම්භ කර මිනිත්තු 25 ක කාලයක් පැවැත්වේ. එක්තරා සඳුදා දිනක රැස්වීම මිනිත්තු 15ක් ප්‍රමාද වී පටන් ගත් අතර මිනිත්තු 10ක් වැඩිපුර රැස්වීම පැවැත්වූවේ ය. එදින රැස්වීම අවසන් වූ වේලාව ලියන්න

..........................................................................................................................


24. මනුලගේ උපන්දිනයට තව දින 105ක් ඇත. එම දින ගණන සතිවලින් ලියන්න.

..........................................................................................................................

25. ගවුම් 6ක මිල රුපියල් 3840කි. එයින් ගවුම් 2ක් මිල දී ගත් සමන් වෙළෙන්දාට නෝට්ටු දෙකක් දුන් විට ඔහුට ඉතුරු මුදල ලෙස රුපියල් 220ක් ලැබුණි නම් දෙන ලද නෝට්ටු දෙක මොනවාද?

..........................................................................................................................

26. අමාලි සහ විමාලි ළඟ ඇති රිබන් පටි දෙකක දිග පිළිවෙළින් පහත දැක්වේ.





දිගින් වැඩි රිබන් පටිය ඇත්තේ කා ළඟ ද? ..........................................................................................

එය අනෙක් රිබන් පටියට වඩා කොපමණ දිගින් වැඩි ද? ...........................................................................

27. වෙළෙන්දෙක් පළමු දිනයේ දී අමු ගම්මිරිස් 18kgක් හා දෙවන දිනයේ 7kg 280g ක් මිල දී ගත්තේ ය. එම ගම්මිරිස් වේලුණු පසු එහි බර 1kg 200g කින් අඩු වී තිබුණි නම් දැන් ගම්මිරිස්වල බර කොපමණ ද?


..........................................................................................

28. භාජනයක තිබූ කිරි ප්‍රමාණය පහත දැක්වේ. විකිණීම සඳහා එම කිරි, බෝතල් 6 කට දැම්මේ නම් එක් බෝතලයක ඇති කිරි ප්‍රමාණය කොපමණ ද?




...........l .....................ml

29. එක්තරා පුවත්පතක් දින 5ක් තුළ අලෙවි වී ඇති ආකාරය දැක්වෙන ප්‍රස්තාරයක් පහත දැක්වේ.




i. පුවත්පත් සමාන ප්‍රමාණයක් අලෙවි වී ඇත්තේ කුමන දිනවල දී ද? ................................

ii. අඟහරුවාදාට වඩා සිකුරාදා වැඩිපුර අලෙවි වී ඇති පුවත්පත් ප්‍රමාණය කොපමණ ද?..................

- අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා **යටින් ඉරක් අඳින්න.**

30. ශාකයක වැඩියෙන් ම ජල වාෂ්ප පිටවන්නේ කුමන කොටසින් ද?
(1). මුල්වලින් (2). කඳෙන් (3). පත්‍රවලින්

31. යමක් ස්පර්ශ වූ විගස පත්‍ර හැකිළෙන ශාකය වන්නේ,
(1). මීවන (2). නිදිකුම්බා (3). මොනරකුඩුම්බිය

32. පත්‍ර මගින් බෝවීම සිදුවන ශාක අඩංගු පිළිතුර වන්නේ,
(1). අක්කපාන, බිගෝනියා (2). කරපිංචා, දෙළුම් (3). සේර, ඉඟුරු

33. කැටයම් කරන ලද සත්ත්ව පේළි සහිත ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම කලා නිර්මාණයකි.
(1). පුන්කලස (2). මුරගල (3). සඳකඩ පහණ

34. අලුදෙණියේ බණ්ඩා යන නමින් හඳුන්වන ජාතික වීරයා වන්නේ,
(1). මොනරවිල කැප්පෙටිපොල (2). මහින්ද හිමි (3). ගොංගාලේගොඩ බණ්ඩා

35. සමූහ වශයෙන් ජීවත්වන, වැඩ බෙදා ගෙන ක්‍රියා කරන සතුන් ඇතුළත් පිළිතුර වන්නේ,
(1). සමනලයා, වේයා, කුහුඹුවා
(2). වේයා, කුහුඹුවා, මී මැස්සා
(3). වේයා, බඹරා, පළගැටියා

36. වගාවට හානි කරන සතුන් ආහාරයට ගන්නා නිශාචර පක්ෂියෙකි.
(1). ඇටි කුකුළා (2). දෙමළිච්චා (3). බකමූණා

37. සර්ව භක්ෂක සතෙකි.
(1). ගවයා (2). ලේනා (3). කොටියා

38. නව තාක්ෂණය යොදා ගනිමින් වැඩ පහසු කරන මුළුතැන්ගෙයි උපකරණ සහිත පිළිතුර වන්නේ,
(1). රෙදි සෝදන යන්ත්‍රය, විදුලි පංකාව, හීටරය
(2). හීටරය, පිසින උඳුන, ඇඹරුම් යන්ත්‍රය
(3). ගෑස් උඳුන, මිරිස් ගල, පිසින උඳුන

39. සුඛෝපභෝගී වෙළඳසැලක දී අපට ලැබෙන වාසියක් නොවන්නේ,
(1). බැංකු කාඩ්පත් භාවිත කර ගනුදෙනු කිරීමට හැකි වීම
(2). සෑම භාණ්ඩයක් ම අඩු මිලකට ලබාගැනීමට හැකි වීම
(3). තමාට අවශ්‍ය පරිදි, අවශ්‍ය ද්‍රව්‍ය පමණක් පහසුවෙන් තෝරා ගැනීමට හැකි වීම

40. පාසල් යන වයසේ දරුවන් ආහාර ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණකි.
(1). අධික සීනි, ලුණු සහිත ආහාර බහුල ව භාවිත කිරීම
(2). සෑම ආහාර වේලක් සඳහා ම බත් ආහාරයට ගැනීම
(3). උදෑසන ආහාරය සඳහා පෝෂණීය ආහාර වේලක් ලබා ගැනීම

41. මේදය බහුල ව අඩංගු ආහාර කාණ්ඩය තෝරන්න.
(1). මස්, බිත්තර, සෝයා බෝංචි
(2). තල, මාගරින්, රටකජු
(3). කිරි, බිත්තර, මාළු

42. ශක්තිජනක, වර්ධක, ආරක්ෂක ආහාර පිළිවෙළින් අඩංගු පිළිතුර වන්නේ,
(1). කොස්, ගොටුකොළ, සෝයා බෝංචි
(2). ගොටුකොළ, කොස්, මස්
(3). පාන්, මාළු, මුකුණුවැන්න

43. ඩෙංගු උවදුර මර්දනය කිරීම සඳහා ගත හැකි වඩාත් ඵලදායි පියවර වන්නේ,
(1). ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
(2). මදුරුවන් සිටින ස්ථානවලට දුම් ගැසීම
(3). මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීම

44. නාය යෑමට පෙර දැකිය හැකි ලක්ෂණයකි.
(1). කුරුල්ලන් කෑ ගැසීම (2). ගස් වේගයෙන් සෙලවීම (3). උල්පත් ජලය මඩ පැහැයට හැරීම

45. නොමිලේ තවත් කෙනෙකුට පහසුවෙන් ම දිය හැකි දෙයකි.
(1). ඇඳුම් පැළඳුම් (2). ආහාර පාන (3). ප්‍රිය වචන

46. ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් කුඩා ම දිස්ත්‍රික්කය වන්නේ,
(1). කොළඹ (2). ගම්පහ (3). මහනුවර

47. පරිසරය පිරිසිදු ව තබා ගැනීම වෙනුවෙන් නොකළ යුතු දෙයකි.
(1). නොදිරන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය සඳහා භාර දීම
(2). දිරන අපද්‍රව්‍යවලින් කොම්පෝස්ට් නිපදවීම
(3). පොලිතීන් , ප්ලාස්ටික් වැනි දෑ ගිනි තැබීම

48. වැඩි ජල ප්‍රමාණයක් රඳවා තබා ගත හැක්කේ,
(1). වැලි පසෙහි (2). මැටි පසෙහි (3). බොරළු පසෙහි

49. අසත්‍ය තොරතුරක් සමාජගත වීමෙන්,
(1). පුද්ගලයන් අතර ගැටුම් ඇති වේ
(2). සියලු දෙනා සහයෝගයෙන් ජීවත් වේ
(3). කිසිවෙකුත් එය නොපිළිගනියි


50. ශ්‍රව්‍ය සන්නිවේදනයට පමණක් අයත් වන සන්නිවේදන උපකරණයකි.
(1). රූපවාහිනිය (2). ගුවන් විදුලිය (3). පුවත්පත

51. අතීතයේ පාලනය කිරීමට පහසු වන ලෙස අපේ රට බෙදා තිබූ ආකාරය දැක්වෙන පිළිතුර වන්නේ,
(1). උඩරට, පහත රට, මලය රට
(2). රුහුණු, පිහිටි, මායා
(3). උතුර, දකුණ, මධ්‍යම

52. වර්තමානයේ දී 'බසවක්කුලම' යන නමින් හඳුන්වන වැව අතීතයේ දී හැඳින්වූයේ,
(1). තෝපා වැව ලෙසිනි (2). අභය වැව ලෙසිනි (3). කලා වැව ලෙසිනි

53. නාගදරණ ව්‍යාප්ත වන ක්‍රමය වන්නේ,
(1). සුළං මඟින් (2). සතුන් මඟින් (3). ජලය මඟින්

54. මෙම මෝස්තරය හඳුන්වන නම කුමක් ද?



(1). ලියවැල් (2). අල්පනා (3). පළා පෙති


55. අපේ මුතුන් මිත්තන් වගාවට සුදුසු බීජ තෝරා ගැනීමට සිදු කළ දෙයකි.
(1). බීජ උණු ජලයේ ගිල්වා තැබීම
(2). බීජ ලුණු මිශ්‍ර ජලයේ ගිල්වා තැබීම
(3). බීජ පොල්තෙල් මිශ්‍ර ජලයේ ගිල්වා තැබීම

56. මිහිපිට ඇති ජලය වැඩි වශයෙන් ම පවතිනුයේ,
(1). අයිස් ලෙස (2). මිරිදිය ලෙස (3). කරදිය ලෙස

57. ළිඳකින් වතුර ඇදීමේ දී ' කප්පිය' මඟින් සිදු වන්නේ,
(1). වතුර බාල්දියේ බර අඩුවීම
(2). බාල්දියට වැඩි ජල ප්‍රමාණයක් පිරීම
(3). ඉහළට ඇදීම පහසු වීම

58. මාලිමාව භාවිතයට ගන්නා පුද්ගලයින් ඇතුළත් පිළිතුර වන්නේ,
(1). හමුදා සෙබළුන්, ගුවන් නියමුවන්, ව්‍යාපාරිකයන්
(2). රියදුරන්, ධීවරයන්, හමුදා සෙබළුන්
(3). ගුවන් නියමුවන්, නාවිකයින්, හමුදා සෙබළුන්

59. මෙම රූප සටහනට අනුව නිවැරදි පිළිතුර වන්නේ,



(1). A බල්බය පමණක් දැල්වේ
(2). B බල්බය පමණක් දැල්වේ
(3). A හා B බල්බ දෙකම එකවර දැල්වේ

60. පාසලේ පැවැති නිවාසාන්තර ළමා මලල ක්‍රීඩා උත්සවයේ දී නිවාස මට්ටමින් ජයග්‍රහණය ලබාගැනීමට සියලු ම ළමයි එකට එකතු වී කැපවීමෙන් කටයුතු කළහ. එමඟින් ඔවුන් අතර තිබූ බැඳීම තවත් ශක්තිමත් විය. මේ අනුව, **"එකමුතුව පොදු වැඩක් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන"** යන මාතෘකාව යටතේ වාක්‍ය තුනක් ලියන්න.
(සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

1. ..........................................................................................................................................

..........................................................................................................................................

2. ..........................................................................................................................................

..........................................................................................................................................

3. ..........................................................................................................................................

..........................................................................................................................................